# මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
# முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களம்
# Department of Muslim Religious and Cultural Affairs.



## කාර්ය සාධන වාර්තාව - 2016
## முன்னேற்ற அறிக்கை - 2016
## Annual Performance Report – 2016

## වැය ශීර්ෂය - 202
## செலவினத் தலைப்பு - 202
## Expenditure Head - 202


**මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**අංක 180, ටී.බී. ජායා මාවත,**

**කොළඹ 10.**

# දැක්ම

ශ්‍රී ලංකාව තුල
ඉස්ලාමීය ආගමික සාරධර්ම හා සංස්කෘතික
වටිනාකම් අතින් පිරිපුන්
ඉතා උසස් මුස්ලිම්
ජන සමාජයක්.

# මෙහෙවර

ශ්‍රී ලාංකික මුස්ලිම් ජන සමාජයේ
උන්නතිය සහ යහ පැවැත්ම උදෙසා
සියලු කාර්යයන්
මැනවින් සංවිධානය කිරීම,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික ආයතන
සම්බන්ධීකරණය හා මෙහෙයවීම
සහ
වකුෆ් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින්
ඉතා උසස් මුස්ලිම් ජන සමාජයක්
බිහි කිරීමට උරදීම.

## පටුන


| | පිටු අංක |
|---|---|
| 1. හැඳින්වීම | 4 |
| 2. දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යභාරය | 4-6 |
| 2.1 අරමුණු | |
| 2.2 දෙපාර්තමේන්තු කාර්යභාරය | |
| 3. සංවිධාන ව්‍යුහය | 6-7 |
| 4. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විස්තර | 8 |
| 4.1 අනුමත කාර්ය මණ්ඩලය | |
| 4.2 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම් | |
| 5. පරිපාලන හා සංවර්ධන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් | 9-13 |
| 5.1 පරිපාලන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන් | |
| 5.1.1 පුහුණු වැඩසටහහන් | |
| 5.1.2 විදේශීය පුහුණු වැඩසටහන් | |
| 5.2 සංවර්ධන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන් | |
| *6.* මුල්‍ය අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් සහ මූල්‍ය වාර්තා | 13 |
| 6.1 මුල්‍ය අංශය මඟින් ඉටුකරන ලද කාර්යයන් | |
| 6.2 මූල්‍ය වාර්තා | |
| 6.2.1 පුනරාවර්තන | |
| 6.2.2 මූලධන | |
| 6.2.3 අත්තිකාරම් ගිණුම් | |
| 7. ආගමික හා සංස්කෘතික කටයුතු අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්. | 16-20 |
| 8. වකූෆ් හා පල්ලි පරිපාලන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්. | 20 |
| 9ග **අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්** | **21** |
| 10. අභ්‍යන්තර විගණන හා විමර්ෂන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් | 21 |
| 11. දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි වූ බාධාවන් සහ දුෂ්කරතා | 22 |

## 01. හැඳින්වීම

**තැපැල්,තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු** අමාත්‍යාංශය යටතේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාත්මක ආයතනය ලෙස මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ශ්‍රී ලංකාව තුල ඉස්ලාමීය ආගමික සාරධර්ම හා සංස්කෘතික වටිනාකම් අතින් පිරිපුන් ඉතා උසස් මුස්ලිම් ජන සමාජයක් ඇති කිරීමේ “දැක්ම” පෙරදැරිව මුස්ලිම් ජන සමාජයේ උන්නතිය සහ යහපැවැත්ම උදෙසා සමස්ත කාර්යභාරය නියාමනය කිරීමේ වගකීමට මෙම දෙපාර්තමේන්තුව උරදරා සිටී.

1962 අංක 21 හා 1982 අංක 33 දරන පනත් මගින් සංශෝධිත 1956 අංක 51 දරන වකුෆ් පනතින් අරමුණු කරගත් කාර්යභාරයන් ඉටුකිරීමෙහිලා ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා වකුෆ් සභාව හා වකුෆ් විනිශ්චය සභාව යන ආයතනයන් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් වකුෆ් පනතේ අරමුණු ප්‍රකාර මුස්ලිම් පල්ලි, සිද්ධස්ථාන හා ආගමික ආයතන ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මුස්ලිම් ආගමික ස්ථානවල හා මුස්ලිම් පුණ්‍යාභාරවල හෝ වකුෆ් භාරවල භාරකරුවන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය නියම කිරීම, මුස්ලිම් පුණ්‍යාභාර අරමුදල් පවත්වාගෙන යාම යන කරුණු මැනවින් ඉටුවන අයුරින් පරිපාලන කටයුතු දියත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තුල අන්තර්ගත වී ඇත. වකුෆ් පනතින් විධිවිධාන සලසන ලද පරිපාලන ක්‍රියාකාරකම් ආවරණය කරමින්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික අනන්‍යතාවය සුරක්ෂණයට අවශ්‍ය පියවර ගනිමින් ජන සමාජයේ යහපත උදෙසා සුභසාධක පහසුකම් සලසමින් සියලුතන්හි ක්‍රියාත්මක වේ.

## 02. දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යභාරය

### 2.1 අරමුණු :

1. මුස්ලිම් පල්ලි, පුණ්‍යාධාර අරමුදල හා ඒවායේ වත්කම් පාලනය හා මෙහෙයවීම.
2. ඉස්ලාම් ආගමික ආයතන හා ඒවායේ වත්කම් පාලනය හා මෙහෙයවීම.
3. ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
4. ඉස්ලාමීය සංස්කෘතික අංග/ කටයුතු පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
5. හජ් වන්දනාකරුවන් සඳහා පහසුකම් හා සේවා සම්පාදනය කිරීම.
6. ඉස්ලාමීය ආගමික හා සංස්කෘතික ක්ෂේත්‍රවලදී ජන සමාජයට සේවාවක් කිරීම.
7. ඉස්ලාම් ආගමික ශික්ෂණයන් ඉටුකිරීම සඳහා (පස්වේල් නමස්කාර කිරීම සහ රාමසාන් උපවාසය වැනි) අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම.
8. කාලීන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මාර්ගෝපදේශ ලබාදීම.
9. මුස්ලිම් ජන සමාජයේ එකමුතු බව පවත්වාගෙන යාම සහ ජාතික ඒකාබද්ධතාව සඳහා ක්‍රියාකිරීම.

## 2.2 දෙපාර්තමේන්තු කාර්යභාරය

1. මුස්ලිම් පල්ලි ඇතුළු ආගමික ස්ථාන ලියාපදිංචිය සහ භාරකරුවන් පත්කිරීම.

2. මුස්ලිම් පුණ්‍යාධාර භාර අරමුදල ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සහ වකුෆ් පනත ක්‍රියාත්මක කිරීම.
3. ලියාපදිංචි කරන ලද මුස්ලිම් දේවස්ථාන, අහදියා (දහම් පාසල්), අරාබි විද්‍යාල, කුර්ආන් මද්රසා ඇතුළු ආගමික ආයතන සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම.

4. ශුද්ධ වූ රාමසාන් මාසයේ ආරම්භය සහ සමාප්තිය නිවේදනය කිරීම සහ ''රාමසාන්'' මාසය වෙනුවෙන් විදේශ මුස්ලිම් රටවල්වලින් මෙරටට ප්‍රදානය කරනු ලබන රටඉඳි දිස්ත්‍රික් මට්ටමින් අදාල ප්‍රධාන දේවස්ථාන හරහා දිවයින පුරා සිටින මුස්ලිම් ජනතාවට බෙදාහැරීම.

5. ජාතික මීලාදුන් නබි දිනය සනිටුහන් කරමින් සෑම වසරක් පාසාම දිවයිනේ එක් දිස්ත්‍රික්කයක් තෝරාගෙන එම දිස්ත්‍රික්කය පුරා ආගමික හා සමාජයීය සංවර්ධනය ඇති කිරීම. එහිදී අදාල ප්‍රදේශය මුස්ලිම් දේවස්ථාන, ආගමික ආයතන, මුස්ලිම් සහ මුස්ලිම් නොවන පාසල්වල සංවර්ධන කටයුතු සිදුකිරීම, විවිධ වැඩසටහන්, තරඟ හා ත්‍යාග ප්‍රදානෝත්සව සංවිධානය කිරීම, ආගමික පුරෝගාමීන්ට ගෞරවාචාරය පුදකිරීම, අදාල ප්‍රදේශයේ ඓතිහාසික වශයෙන් වැදගත් පොත් ප්‍රකාශනය යනාදී ක්‍රියාකාරකම් සිදුකෙරේ.

6. ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාව ශුද්ධ වූ හජ් වන්දනාවෙහි යෙදීම සඳහා පහත පරිදි අවශ්‍ය කටයුතු සලසාදීම.
   - ❖ සුදුසු නියෝජිතයන් ලියාපදිංචිය සහ බලපත්‍ර නිකුත් කිරීම.
   - ❖ වැඩසටහන පිළිබඳව වන්දනාකරුවන් දැනුවත් කිරීම.
   - ❖ හජ් වන්දනාව පිළිබඳ මාර්ගෝපදේශන පොත් බෙදාහැරීම.
   - ❖ වන්දනාකරුවන් සඳහා ගුවන් ප්‍රවාහන කටයුතු සංවිධානය.
   - ❖ හජ් වන්දනාව සඳහා සෞදි අරාබි රාජධානියේ රැඳී සිටින කාලය තුල වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සහ මාර්ගෝපදේශ ලබා දීම.
   - ❖ හජ් වන්දනා කාලය තුල වන්දනාකරුවන් සඳහා වෛද්‍ය සේවා කටයුතු සලසාදීම.
   - ❖ බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේදී සහ ජිද්දා අන්තර්ජාතික ගුවන්තොටුපළේදී හජ් වන්දනාකරුවන්ට මගපෙන්වීම සහ අවශ්‍ය පහසුකම් සලසාදීම.
   - ❖ සෞදි අරාබි රාජධානියේදී හජ් නියෝජිතයින් සලසන සේවාවන් නිරීක්ෂණය කිරීම සහ
   - ❖ අඩුපාඩු නිවැරදි කිරීම.

7. දිවයින පුරා අහදියා දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිල ඇඳුම්, පුස්තකාල පොත් දීමනා ලබාදීම, දහම් පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම සහ අහදියා දහම් පාසල් සඳහා විෂය නිර්දේශයක් හඳුන්වාදීම.

8. මුස්ලිම් සුභසාධන සමිති ලියාපදිංචිය සහ එම කටයුතු පවත්වාගෙන යාමට දායකවීම.

9. ඉස්ලාම් පෙර පාසල් ගුරුවරුන් සඳහා පුහුණුවක් ලබාදීම සහ එම කටයුතු පවත්වාගෙන යාමට දායකවීම.

10. කලාකරුවන්ට ගෞරව සත්කාර දැක්වීම පිණිස වාර්ෂිකව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කලාභූෂණ සම්මාන උළෙල සඳහා සුදුසු කලාකරුවන් නිර්දේශ කිරීම.

11. මුස්ලිම් කතුවරුන් ධෛර්යමත් කිරීම සඳහා ඔවුන් විසින් නිර්මාණය කරන ලද පොත් පත් මිලදී ගෙන මුස්ලිම් පාසල් පුස්තකාලවලට බෙදාහැරීම.

12. පල්ලි දායක සහා සාමාජිකයන්ට ඉස්ලාම් ආගමික ආයතනවල පරිපාලන සහා සාමාජිකයන්ට පුහුණුවක් ලබාදීම.

13. අන්තර්ජාතික තරඟ සඳහා (අල්කුර්ආනය පාරායණය කිරීම) අපේක්ෂකයින් තේරීම. මෙම තරඟ වාර්ෂිකව ඊජිප්තුව, ඉරානය, මැලේසියාව සහ ඩුබායි යන විදෙස් රටවල්වලදී පැවැත්වේ.

14. ඉස්ලාමීය උසස් අධ්‍යාපන කටයුතු සඳහා සිසුන් තේරීම.

15. ඉස්ලාම් ආගමික පූජකවරුන් (මවුලවිවරු) සඳහා විශේෂ හැඳුනුම්පත් ලබාදීම.


16. විදේශ රැකියා සඳහා සෞදි අරාබිය බලා පිටත්ව යන මුස්ලිම් ජාතිකයන් වෙනුවෙන් ඔවුනගේ ජන වර්ගය තහවුරු කිරීම සඳහා ආගමික සහතිකපත් නිකුත් කිරීම.

## 03. සංවිධාන ව්‍යුහය

ඉහත කාර්යභාරය සාධනය උදෙසා ප්‍රධාන අංශ 05කින් සමන්විත වන අයුරින් මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය සකස්කර ඇති අතර, අදාල අංශ පහත සඳහන් පරිදි වේ.

1. පරිපාලන හා සංවර්ධන අංශය
2. මූල්‍ය අංශය
3. ආගමික හා සංස්කෘතික කටයුතු අංශය
4. වකුෆ් අංශය
5. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

## සංවිධාන ව්‍යුහය
## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව



## 04. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විස්තර

### 4.1 අනුමත කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය තුල අනුමත කාර්ය මණ්ඩලය 123 ක් වන අතර, 2016.12.31 දිනට අදාල කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

| අනු. අංකය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | අනියම් | |
| 01 | අධ්‍යක්ෂ | 01 | 01 | - | 0 |
| 02 | ගණකාධිකාරී | 01 | 01 | - | 0 |
| 03 | අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ.) | 01 | - | - | 01 |
| 04 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.) | 04 | 02 | - | 02 |
| 05 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.නොවන) | 02 | 0 | - | 02 |
| 06 | පරිපාලන නිලධාරී | 01 | 0 | - | 01 |
| 07 | භාෂා පරිවර්තක (සිං/දෙ) | 01 | 0 | - | 01 |
| 08 | වකුෆ් මණ්ඩල ලේකම් | 01 | 0 | - | 01 |
| 09 | වකුෆ් විනිශ්චය සභා ලේකම් | 01 | 0 | - | 01 |
| 10 | විමර්ශන නිලධාරී | 02 | 0 | - | 02 |
| 11 | සංස්කෘතික නිලධාරී | 03 | 03 | - | 0 |
| 12 | සංස්කෘතික සහකාර | 15 | 09 | - | 06 |
| 13 | පුණ්‍යාධාර සහකාර | 01 | 01 | - | 0 |
| 14 | සංවර්ධන නිලධාරී | 50 | 25 | - | 25 |
| 15 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 22 | 18 | - | 04 |
| 16 | රියදුරු | 04 | 04 | - | 0 |
| 17 | කා.කා.ස. | 13 | 13 | | 0 |
| | **එකතුව** | **123** | **77** | | **46** |
| | **උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණුවන්නන්** | | **27** | | |
| | **සම්පූර්ණ එකතුව** | **123** | **104** | | **46** |

### 4.2 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම්

**2016 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම්**

| | | |
|---|---|---|
| ස්ථාන මාරුවීම් | පැමිණීම් | 02 |
| | පිටවීම් | 04 |
| පත් කිරීම් | ස්ථිර | - |
| | අනියම් | - |
| උසස් කිරීම් | - | |
| සේවයෙන් පහ කිරීම් | - | |
| තනතුරු අතහැර යාම් | - | |
| ඉල්ලා අස්වීම් | - | |
| විශ්‍රාම ගැනීම් | - | |
| මිය යෑම් | - | |
| වෙනත් * | 27 | |

❖ **උපාධිධාරී අභ්‍යාසලාභීන් 27 දෙනෙකු පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත.**

## 05. පරිපාලන හා සංවර්ධන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්

### 5.1 පරිපාලන ශාඛාව මඟින් ඉටු කරන ලද කාර්යයන්

දෙපාර්තමේන්තුවට අයත් සියළුම තනතුරු හා සේවාවන්ට අයත් පත් කිරීමේ සිට විශ්‍රාම යාම දක්වා වූ ස්ථාන මාරු කිරීම්, උසස් කිරීම්, විනය කටයුතු සේවා දීර්ඝ කිරීම ආදි රාජකාරි කටයුතු මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන ආයතන අවශ්‍ය පරිදි සම්බන්ධීකරණය කර ගනිමින් සිදු කිරීම.

- ❖ දෙපාර්තමේන්තුවට අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර, නිර්දේශ ලබා ගැනීම සහ අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.
- ❖ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.
- ❖ තැපැල.
- ❖ දේශීය හා විදේශීය නිවාඩු සම්බන්ධ කටයුතු.
- ❖ දුම්රිය බලපත්‍ර / දුම්රිය අනුග්‍රහ වාරප්‍රවේශපත්‍ර සම්බන්ධ කටයුතු.
- ❖ වාහන නඩත්තුව සහ ප්‍රවාහන පහසුකම් සැපයීම/ උපදේශක කාරක සභා සඳහා පිළිතුරු සැපයීම.
- ❖ මැතිවරණ රාජකාරි කටයුතු.
- ❖ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ඒ සඳහා යොමු කිරීම.
- ❖ පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම.
- ❖ කාර්යාල උපකරණ නඩත්තු කටයුතු.
- ❖ කාර්යාල ගොඩනැගිලි නඩත්තු කටයුතු.
- ❖ අග්‍රහාර රක්ෂණ කටයුතු.
- ❖ ණය අත්තිකාරම් අනුමත කිරීම.

**5.1.1 පුහුණු වැඩසටහහන්**

**<u>2016 වර්ෂයේදී මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු නිලධාරින් සහභාගී වූ දේශීය පුහුණු වැඩසටහන්</u>**

**2016 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතිපාදන - රු.200,000.00**
**2016 වර්ෂයේ පුහුණු වැඩසටහන් සදහා වියදම - රු.198,070.00**

| අනු අංකය | පුහුණු වැඩසටහනේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරින් සංඛ්‍යාව | කාලය (දින) |
|---|---|---|---|---|
| 1 | භාෂා පුහුණු පාඨමාලාව - ඉංග්‍රීසි | විවෘත විශ්ව විද්‍යාලය | 01 | මාස 4 |
| 2 | විස්තරාත්මක ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටි | ප්‍රාග් ආයතනය | 02 | 03 |
| 3 | Workshop on Communication Skills for Emerging Leaders | Skills Development Fund Ltd | 02 | 01 |
| 4 | සේවාරම්භක පුහුණු වැඩසටහන | Skills Development Fund Ltd | 04 | 02 |
| 5 | මුස්ලිම් පල්ලි පරිපාලනය සහ සංවර්ධන වැඩසටහන් පිළිබද ක්ෂේත්‍ර නිළධාරි පුහුණු වැඩසටහන | තැපැල්,තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 50 | 01 |
| 6 | Pay Roll | මිලෝදා ආයතනය | 01 | 03 |
| 7 | භාෂා පුහුණු පාඨමාලාව - සිංහල | විවෘත විශ්ව විද්‍යාලය | 01 | මාස 4 |
| 8 | Leading for Excellent Result | Skills Development Fund Ltd | 01 | 02 |
| 9 | Event Management | ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනය | 05 | 01 |
| 10 | කාර්යාල කාර්ය සහායක නිළධාරීන්ගේ වගකීම සහ කාර්ය භාරය | Skills Development Fund Ltd | 02 | 02 |

**5.2 සංවර්ධන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන්**

**මේ යටතේ ප්‍රධාන වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කරන ලදි.**


- දිවයින පුරා ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන.
- ජාතික මීලාදුන් නබි සංවර්ධන වැඩසටහන ( බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කය).

උක්ත සංවර්ධන වැඩසටහන් මගින් මුස්ලිම් පල්ලි, දහම් පාසල්, අරාබි විදුහල්, කුර්ආන් මද්රසා සහ අනෙකුත් ආගමක ස්ථානයන් සංවර්ධනය කිරීම් හා වැඩිදියුණු කිරීම් කරන ලදි. ප්‍රාග්ධන වියදම් යටතේ මෙම

දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් මෙම සංවර්ධන වැඩසටහන් සඳහා පහත පරිදි මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත.

| සංවර්ධන වැඩසටහන | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන ( රු. මිලියන) |
|---|---|
| ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන ( දිවයින පුරා) | 15 |
| ජාතික මීලාදුන් නබි සංවර්ධන වැඩසටහන | 14 |

## 2016 සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය





## දිවයින පුරා පිහිටි ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන


| ආගමික ස්ථානය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | ඉලක්කගත දේවස්ථාන ගණන | 2016.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍ය (රු.මිලියන) |
| 1. මුස්ලිම් පල්ලි | 13.415 | 90 | 90 | 12.750 |
| 2. අරාබි විද්‍යාල | 0.875 | 06 | 06 | 0.875 |
| 3. අහදියා දහම් පාසල්, | 0.550 | 05 | 05 | 0.550 |

| | | | | |
|---|---|---|---|---|
| හිෆ්ලුල් කුර්ආන් මද්රසා සංවර්ධනය | | | | |
| 4. වෙනත් ආගමික ආයතන සංවර්ධනය | 0.16 | 02 | 02 | 0.160 |

දිස්ත්‍රික්ක මට්ටමින් ආගමික ස්ථාන සංවර්ධනය කළ ආකාරය පහත දැක් වේ.




වාර්ෂික මීලාද් සංවර්ධන වැඩසටහන සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම - 2016 වර්ෂයේදි මෙම වැඩසටහන බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කය තෝරාගෙන ක්‍රියාත්මක කල අතර ඒ සඳහා රු. මිලියන 14ක් වෙන්කර ඇති අතර පහත දැක්වෙන පරිදි සංවර්ධන කටයුතු සිදු කරන ලදි.





මෙම සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන්කරන ලද ආකාරය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඉහත දක්වා ඇත.

❖ යෝජිත මුස්ලිම් සංස්කෘතික සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු

කොළඹ 10, ටී.බී. ජායා මාවත, අංක 180 යන ස්ථානයේ ඉදිවෙමින් පවතින යෝජිත මුස්ලිම් සංස්කෘතික සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 2006.11.09 වන දින ආරම්භ වූ අතර මේ සඳහා ඇස්තමේන්තුගත මුදල් රුපියල් මිලියන 596කි. මෙම සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා ඇත. මහල් 9කින් යුත් මෙම සංකීර්ණය මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යාලය, ශ්‍රී ලංකා වකුෆ් සභා කාර්යාලය, වකුෆ් විනිශ්චය සභා කාර්යාලය, අංග සම්පූර්ණ ශ්‍රවණාගාරයක්, පුස්තකාලයක්, නවාතැන් පහසුකම් සඳහා කාමර සහ වාහන නැවතුම්පලක් යන අංග ස්ථාපිත කිරීමට නියමිතය.

අදියර 03කින් ක්‍රියාත්මක වන මෙම ගොඩනැඟිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතුවලින් පළමු (භූගත කුළුණු ඉදිකිරීම) හා දෙවන (කොන්ක්‍රීට් ව්‍යුහය) අදියර අවසන්ව ඇති අතර, මේ වනවිට තෙවන [illegible]රීම් කටයුතු සිදුවෙමින් පවතී. 2014 හා 2015 වර්ෂවල ප්‍රතිපාදන වෙන් [illegible] හේතුවෙන් ඉදිකිරීම් නවතා තිබුණි. 2016 වර්ෂය සඳහා රු.මිලියන 295.5 ක ප්‍රතිපාදන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට ලබා දී ඇත. ඒ අනුව මහල් 04 ක වැඩ අවසන් කිරීමට නියමිත වූ අතර, 2016.12.31 දින වන විට එම කටයුතු අවසන් කරන ලදි. ඉදිකිරීම් සඳහා 2016 වර්ෂයේදී රු.මි.203.05ත් ගෙවීම් සිදු කර ඇත.

**මුස්ලිම් සංස්කෘතික සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සිදුකළ පසු දිස්වෙන ආකාරය**

❖ සංවර්ධන වැඩසටහන් වලට අදාල ප්‍රගති වාර්තා නිසි කලට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරිම.

## 06. මුල්‍ය අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් සහ වාර්තා

### 6.1 මුල්‍ය අංශය මඟින් ඉටුකරන ලද කාර්යයන්

❖ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරිම.
❖ වාර්ෂික විසර්ජන ගිණුම සැකසිම.
❖ ගබඩා කලමණාකරනය.

- ❖ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම් කටයුතු.
- ❖ වවුචර සඳහා ගෙවීම් කටයුතු.
- ❖ වැටුප් හා දීමනා ගෙවීම හා ගිණුම්ගත කිරීම.
- ❖ මූල්‍ය පොත්, ලෙජර හා ලේඛන පවත්වාගෙන යාම.
- ❖ චෙක්පත් නිකුත් කිරීම.
- ❖ මාසික ගිණුම් සාරාංශ සැකසීම.
- ❖ භාණ්ඩාගාරය, විගණකාධිපති, අමාත්‍යාංශය වෙත ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

**6.2** මූල්‍ය වාර්තා

**6.2.1** පුනරාවර්තන (පිටු අංක - 14)

**6.2.2** මූලධන (පිටු අංක - 15)

**6.2.3** අත්තිකාරම් ගිණුම් (පිටු අංක - 15)

**<u>පුනරාවර්තන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලතා පැහැදිලි කිරීම - 2016</u>**

දෙපාර්තමේන්තුවේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු

වියදම් ශීර්ෂ අංකය : 202

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | පුනරාවර්තන වියදම්වල විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | සත්‍ය වියදම රු. | ඉතිරිය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | **ගිවිසුම්ගත සේවා** | | | |
| 2 | 1 | 0 | 1401 | 11 | ප්‍රවාහන වියදම් | 300,000 | 114,161 | **185,839** |
| 2 | 1 | 0 | 1402 | 11 | **සංදේශන** | 850,000 | 816,187 | **33,813** |
| 2 | 1 | 0 | 1403 | 11 | විදුලිය හා ජලය | 900,000 | 771,749 | **128,251** |
| 2 | 1 | 0 | 1404 | 11 | දේශීය බදු හා කුලී ගාස්තු | 500,000 | 164,695 | **335,305** |
| | | | | | **සේවා** | | | |
| 2 | 1 | 0 | 1405 | 11 | වෙනත් | 29,737,121 | 29,121,709 | **615,412** |
| 2 | 1 | 0 | 1501 | 11 | දහම් පාසල් ගුරුවරුන්ගේ නිල ඇඳුම් දීමනා | 7,250,000 | 7,234,322 | **15,678** |
| | | | 1501 | | **පුස්තකාල පොත් දීමනාව** | 9,000,000 | 8,890,000 | **110,000** |
| | | | 1501 | | **දහම් පාසල් පොත් සැකසීම හා මුද්‍රණය** | 4,000,000 | 3,997,950 | **2,050** |
| | | | | | **මාරු කිරීම්** | | | |
| 2 | 1 | 0 | 1506 | 11 | දේපළ ණය පොළී | 80,000 | 79,332 | **668** |
| 2 | 1 | 0 | 1508 | 11 | පොදු ආයතන | 800,000 | 798,000 | **2,000** |
| | | | | | **පුනරාවර්තන වියදම්වල විස්තරය** | | | |
| | | | | | **<u>පුද්ගල පඩි නඩි</u>** | | | |
| 2 | 1 | 0 | 1001 | 11 | **වැටුප් හා වේතන** | 21,250,000 | 18,686,687 | **2,563,313** |
| 2 | 1 | 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,150,000 | 1,098,792 | **51,208** |
| 2 | 1 | 0 | 1003 | 11 | වෙනත් දීමනා | 26,000,000 | 20,786,741 | **5,213,259** |
| | | | | | **<u>ගමන් වියදම්</u>** | | | |
| 2 | 1 | 0 | 1101 | 11 | දේශීය | 700,000 | 598,686 | **101,314** |
| 2 | 1 | 0 | 1102 | 11 | විදේශීය | 670,000 | 668,114 | **1,886** |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | <u>සැපයීම්</u> | | | |
| 2 | 1 | 0 | 1201 | 11 | ලිපි ද්‍රව්‍ය | 1,000,000 | 992,037 | **7,963** |
| 2 | 1 | 0 | 1202 | 11 | ඉන්ධන | 1,100,000 | 911,507 | **188,493** |
| 2 | 1 | 0 | 1203 | 11 | ආහාර පාන හා නිල ඇඳුම් | 100,000 | 81,375 | **18,625** |
| | | | | | <u>නඩත්තු වියදම්</u> | | | |
| 2 | 1 | 0 | 1301 | 11 | වාහන | 950,000 | 943,639 | **6,361** |
| 2 | 1 | 0 | 1302 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 330,000 | 319,069 | **10,931** |
| ඩ | 1 | 0 | 1303 | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 50,000 | 49,508 | **492** |

## <u>මූලධන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලතා පැහැදිලි කිරීම - 2016</u>

**දෙපාර්තමේන්තුවේ නම: මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු**

**වියදම් ශීර්ෂ අංක : 202**

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යාකරණය (සංකේත අංකය) | මූලධන වියදම්වල විස්තර | ශුද්ධ ප්‍රතිපාදන රු. | සත්‍ය වියදම රු. | ඉතිරිය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | <u>මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u> | - | | |
| 2 | 2 | 0 | 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | **200,000** | 199,650 | 350 |
| 2 | 2 | 0 | 2002 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | **200,000** | 109,545 | 90,455 |
| 2 | 2 | 0 | 2003 | 11 | වාහන | **400,000** | 362,257 | 37,743 |
| | | | | | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | |
| 2 | 2 | 0 | 2102 | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීයය උපකරණ | 1,080,000 | 1,074,119 | 5,881 |
| 2 | 2 | 0 | 2103 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 800,000 | 793,975 | 6,025 |
| 2 | 2 | 5 | 2104 | 11 | මුස්ලිම් සංස්කෘතික සංකීර්ණය ඉදි කිරීම | | | 0 |
| | | | | | <u>මානව සම්පත් සංවර්ධනය</u> | | | |
| 2 | 2 | 0 | 2401 | 11 | කාර්ය මණ්ඩල පුහුණු | 200,000 | 198,070 | 1,930 |
| | | | | | <u>වෙනත් මූලධන වියදම් හා වෙනත් ආයෝජන</u> | | | |
| 2 | 2 | 6 | 2502 | 11 | ජාතික මීලාද් සංවර්ධන වැඩ සටහන-මුස්ලිම් සංස්කෘතික සංකීර්ණය ඉදි කිරීම හා වෙනත් | 14,000,000 | 13,281,268 | 718,732 |
| 2 | 2 | 7 | 2502 | 11 | සංවර්ධන වැඩ සටහන් | 15,000,000 | 14,330,800 | 669,200 |
| 2 | 2 | 9 | 2502 | 11 | කාත්තන්කුඩි මුස්ලිම් දේවස්ථානය ඉදි කිරීම | | | 0 |

# <u>අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2016</u>

**වියදම් ශීර්ෂ අංකය: 202** **දෙපාර්තමේන්තුවේ නම: මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු**

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය* | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත් අනුව **2016/12/31** දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | **2016/01/01** දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | **2016/12/31** දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 202011 | 5,827,253.00 | 2,498,530.00 | 1,626,492.00 | 6,699,291.00 | 6,699,291.00 |
| | 202012 | | 270,078.00 | 499,280.00 | -229,202.00 | -229,202.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 5,827,253.00 | 2,768,608.00 | 2,125,772.00 | 6,470,089.00 | 6,470,089.00 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III විවිධ අත්තිකාරම් | | | | | | |
| IV තැන්පත් | | | | | | |
| (i) පොදු තැන්පත් | 6000/0016/0094 | 17,415,648.00 | | | 17,415,648.00 | 17,415,648.00 |
| | 6000/0002/0148 | | 25,975.00 | 25,975.00 | 0.00 | 0.00 |
| | 6000/0018/0097 | | 220,225.00 | 220,225.00 | 0.00 | 0.00 |
| (ii) අනෙකුත් තැන්පත් | | | | | | |

## 07 ආගමික හා සංස්කෘතික කටයුතු අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්.

- ❖ අරාබි විදුහල් ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
- ❖ හිෆ්ලුල් කුර්ආන් මද්රසා ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
- ❖ කුර්ආන් මද්රසා ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
- ❖ අහදියා දහම් පාසල් ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම.
- ❖ අහදියා දහම් පාසල් නිල ඇඳුම් බෙදාදීම.
- ❖ අහදියා දහම් පාසල් ගුරුවරුන්ට පොත් දීමනාවක් ලබා දීම.
- ❖ හජ් වන්දනා කටයුතු සංවිධානය කිරීම.
- ❖ වාස විසා නිර්දේශ කිරීම.
- ❖ ආගම හා ආගමික ආයතන හා සම්බන්ධ පොත් පත් බඩු භාණ්ඩ සඳහා තීරුබදු සහන ලබා දීමට නිර්දේශ කිරීම.
- ❖ අරාබි විදුහල් වල තෝරාගත් සිසුන් ඊජිප්තුවේ අල් අස්හාර් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්ව වැඩ සටහනකට යොමු කිරීම.
- ❖ රාමසාන් උපවාස සමයේදී මුස්ලිම් පල්ලිවලට හා බැතිමතුන්ට අවශ්‍ය රටඉඳි බෙදා හැරීමට ක්‍රියා කිරීම.

- ❖ උපවාස සමය තුල බැතිමතුන් වෙනුවෙන් සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරානය යන රටවල්වලින් මෙරටට පරිත්‍යාග කරන ලද රටඉඳි මෙට්‍රික් ටොන් 222 ක් දිස්ත්‍රික් මට්ටමින් මහ පල්ලි හරහා බෙදාහැරීමට කටයුතු කරන ලදී. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත පුනරාවර්තන වියදම් යටතේ වෙන්කරන ලද රුපියල් මිලියන 22.1 ක ප්‍රතිපාදනය යොදාගන්නා ලදී.

- ❖ ජාතික මීලාදුන් නබි ජන්ම දින රාජ්‍ය උත්සවය පැවැත්වීම.

ලෝකවාසී මුස්ලිම් ජනතාව ඉතා භක්තියෙන් යුතුව සමරන ශුද්ධ වූ මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ ජන්ම දිනය 2016.12.12 වන දිනට යෙදී තිබූ අතර, එය බදුල්ල දිස්ත්‍රික්කය මුල්කර ගනිමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. ජාතික මීලාදුන් නබි සමාරම්භක උත්සවය තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු ගරු අමාත්‍ය එම්.එච්.ඒ.හලීම් මැතිතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.12.12 දින ගුරුතලාව, ප්‍රාදේශීය සභා පිටියේදී පවත්වන ලදී.



**මීලාදුන් නබි උත්සවයට සහභාගී වූ තීළධාරීන්ගෙන් කොටසක**

❖ ජාතික මිලාදුන් නබි ජන්ම දිනය නිමිත්තෙන් පළාත් හා ජාතික තරඟ පැවැත්වීම.

| 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | 2016.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) | 2016.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 1.135 | 1.133 | සමස්ත ලංකා අවසන් මහා තරඟය 2016 නොවැම්බර් මස 05,06 යන දිනයන්හිදී කොළඹ-12 පාතිමා බාලිකා විද්‍යාලයේදී පවත්වන ලදී. ජයග්‍රහකයින් සඳහා තිළිණ |

වාර්ෂිකව පවත්වන මෙම උත්සවය නිමිත්තෙන් දිවයින පුරා පාසල් සිසු සිසුවියන් අතර කථික, කෙටි කථා, රචනා, පද්‍ය රචනා, ගායනා, අරාබි අක්ෂර මෝස්තර සහ අල්කුර්ආන් පාරායණය කිරීම යන ඉසව් යටතේ තරඟ පවත්වනු ලබයි. එක් එක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල අධීක්ෂණය යටතේ පළාත් මට්ටමින් තරඟ පවත්වා එහි පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබා ගන්නා තරඟකරුවන් සමස්ත ලංකා අවසාන මහා තරඟයට යොමුකරනු ලබයි. ජාතික මීලාදුන් නබි අවසන් මහ තරගයෙන් ප්‍රථම ස්ථානය ලබා ගත් ජයග්‍රහකයන් 75 කු සඳහා තිළිණ හා සහතිකපත්‍ර ගුරුතලාව, ප්‍රාදේශීය සභා පිටියේදී 2016.12.12දින පැවැති ජාතික මීලාදුන් නබි සමාරම්භක උත්සවයේදී ගරු අග්‍රාමාත්‍යතුමා අතින් පිරිනමන ලදී.



| | | |
|---|---|---|
| | | 2016.12.12 දින ජාතික මීලාදුන් නබි සමාරම්භක උත්සවයේදී ගරු අග්‍රාමාත්‍යතුමා අතින් පිරිනමන ලදි. |

❖ වාර්ෂික කලාභූෂණ සම්මාන උලෙළ සඳහා මුස්ලිම් කලාකරුවන්ගේ නාම යෝජනා ඉදිරිපත් කිරිම.

මුස්ලිම් කලාකරුවන්ට ගෞරව සත්කාර දැක්වීමට සහ ඔවුන් ඇගයීම පිණිස වාර්ෂිකව සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් දෙසැම්බර් මස 15 දින කලාභූෂණ සම්මාන උළෙළ පවත්වන අතර ඒ සඳහා සුදුසු කලාකරුවන් නිර්දේශ කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. මෙවර කලාකරුවන් 28 දෙනෙකුගෙන් අයදුම්පත් ලද අතර ඒ අතරින් 25 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කොළඹ 07 පිහිටි නෙලුම් පොකුණ රංග පීඨයේදී පිරිනමන ලදි.

❖ මුහර්රම් දිනය




ඉස්ලාමීය දින දර්ශනය අනුව මුස්ලිම් බැතිමතුන්ගේ අලුත් අවුරුද්ද ආරම්භ කරන්නේ මුහර්රම් මාසයෙනි. මෙය පරිත්‍යාගශීලී මාසයයි. 2016 වසරේ මුස්ලිම් බැතිමතුන්ගේ අලුත් අවුරුදු උදාව ඔක්තෝබර් මස 02 දින යෙදී තිබුණි. දහම් පාසල් සිසුන්ගේ ආගමික වැඩසටහන් සමග මුහර්රම් දිනය දෙමටගොඩ, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථානයේදී සමරන ලදි.

❖ හජ් වැඩසටහන

2016 වසරේ හජ් වන්දනා කටයුතු සඳහා සෞදි අරාබි රාජධානියේ මක්කම බලා යාමට ශ්‍රී ලාංකික බැතිමතුන් 2400 දෙනෙකු සඳහා අවශ්‍ය කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදි. මෙම බැතිමතුන් වෙනුවෙන් පහසුකම් සලසා දීමට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි හජ් නියෝජිත ආයතන 86 ක් වන්දනා ගමන සාර්ථක කර ගැනීම සඳහා තෝරා ගන්නා ලදි.

❖

❖ මුස්ලිම් ලේඛකයන් දිරිමත් කිරිම උදෙසා ඔවුන්ගේ ප්‍රකාශන මිලදි ගැනිම හා ඒවා මුස්ලිම් පාසල් පුස්තකාල වලට බෙදා හැරිම.

මේ සඳහා පුනරාවර්ථන වියදම් යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන මිලියන 0.3 ක් යොදා ගත් අතර කතුවරුන් 48 දෙනෙකුගේ ග්‍රන්ථ ලබා ගන්නා ලදි.

ඉස්ලාමීය පූජකවරුන් (මවුලවිවරු) සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

2016 වර්ෂයේ දිවයින පුරා ඉස්ලාම් ආගමික පූජකවරුන් 157 දෙනෙකු සඳහා හැඳුනුම්පත් නිකුත් කර ඇත.

❖ අල්කුර් ආන් තරඟ පැවැත්විම හා එමඟින් ජාත්‍යන්තර තරඟ සඳහා සුදුස්සන් තෝරා ගැනිම.

ජාත්‍යන්තර අල් කුර්ආන් පාරායණය කිරීමේ ( කිරාත් ) තරග සඳහා තේරීම් තරග කොළඹ 12, ෆාතිමා බාලිකා කාන්තා විදුහලේදී 2016 මාර්තු මස 12 සහ 13 දිනවලදී පැවැත්වූ අතර ඉසව් 07 ක් යටතේ තරග කරන ලද ප්‍රථම ස්ථානය ලබා ගත් ජයග්‍රාහකයින්ට සහතික ප්‍රදානය ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය එම්.එච්.ඒ.හලීම් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්

2016 අප්‍රේල් මස 28 දින තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. ඒ අතරින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට දෙදෙනෙකුද තුර්කි රාජ්‍යයට දෙදෙනෙකුද මැලේසියාවට දෙදෙනෙකුද යැවීමට තෝරා ගෙන ඔවුන් අදාල තරග සඳහා යොමු කරන ලදි.

❖ රාජ්‍ය උත්සව අවස්ථාවන් සඳහා ඉස්ලාම් ආගමික පූජක නියෝජනය සම්බන්ධීකරණය හා අවශ්‍ය කටයුතු සම්පාදනය.

❖ වාස වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි නිකුත් කිරීම

විදේශයන්හි සිට පල්ලි කටයුතු සඳහා පැමිණෙන පූජකවරුන්ට අරාබි විදුහල් කුර්ආන් මද්රසාවල ඉගැන්වීම් කටයුතු සඳහා පැමිණෙන ගුරුවරුන්ට සහ ශිෂ්‍යයන්ට මෙරට ගතකරන කාලසීමාව සඳහා වාස වීසා ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලිපි නිකුත් කිරීමේ කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

❖ කුර්ආන් මද්රසා සඳහා වන වැඩසටහන්

කුර්ආන් මද්රසා 1600 ක් පමණ මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අතර, මෙම වර්ෂයේදී නව කුර්ආන් මද්රසා 30 ක් ලියාපදිංචි කර ඇත. වාර්ෂිකව එක් මද්රසාවකට රු.6000.00 බැගින් තෝරාගන්නා ලද දුෂ්කර කුර්ආන් මද්රසා සඳහා පරිපාලන වියදම් පියවා ගැනීමට මුදල් ආධාර ප්‍රදානය කරනු ලැබේ. ඒ අනුව 2016 වසරේදී කුර්ආන් මද්රසා 133කට ආධාර ලබා දෙන ලදි.

| 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන ( රු . මිලියන ) | 2016.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය ( රු . මිලියන ) | 2016.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 0.8 | 0.798 | 99.75% |

❖ දහම් පාසල් සඳහා වන වැඩසටහන්

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි දහම් පාසල්වල ගුරුභවතුන් සඳහා වාර්ෂිකව නිල ඇඳුම් සහ පොත් දීමනාවක් ලබා දීම සිදු කෙරේ. මීට අමතරව දහම් පාසල් අවසන් සහතික පත්‍රය විභාගයේ විෂය නිර්දේශයන්ට අනුකූලව දෙමළ මාධයයෙන් සකසන ලද පෙළ පොත් 04 ක් සහ ඉස්ලාමීය දීනියාත් ( ධර්මචාර්ය ) සහතික පත්‍ර විභාගය සඳහා සකසන ලද පෙළ පොත් 06 ක් වශයෙන් සකස් කරන ලද පෙළ පොත් 10 ක් දෙමළ මාධ්‍යයේ සිට සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන්ට පරිවර්තනය කරන ලද පොත් 20 ක් මුද්‍රණය කටයුතු සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාර දී ඇත.

| | **2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන)** | **2016.12.31 දිනට ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **භෞතික** | **මූල්‍ය (රු. මිලියන)** |
| I. නිල ඇඳුම් ලබාදීම. | 7.250 | දහම් පාසල් ගුරුවරුන් 4445 දෙනෙකු වෙත බෙදා හැරීම සඳහා නිල ඇඳුම් මිලදී ගන්නා ලදී. 99.78% | 7.234 |
| II. පොත් දීමනාව | 9.0 | එක් ගුරුවරයෙකුට රු 2000 බැගින් දහම් පාසල් ගුරුවරුන් 4445 දෙනෙකු | 8.890 |

| | | | |
|---|---|---|---|
| | | වෙත ලබාදී ඇත. 98.78% | |
| III. අහදියා දහම් පාසල් සඳහා විෂය නිර්දේශයන්ට අනුකූලව සකසන ලද පෙළ පොත් 09ක් මුද්‍රණය කිරීම | 4.0 | පරිවර්තනය කරන ලද පෙළපොත් 20 ක් මුද්‍රණය කටයුතු සඳහා භාර දී ඇත. 99.95% | 3.997 |
| IV. අහදියා දහම් පාසල් ප්‍රශ්න පත්‍ර ඇගයීම සඳහා මූලා ප්‍රතිපාදන සලසාදීම. | 0.4 | විභාගය ඔක්තෝබර් මස සාර්ථකව පවත්වන ලදී.84.85% | 0.339 |

❖ **ආගමික සහජීවන දහම් පාසල් වැඩසටහන**

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සියලු ආගම්වල සංස්කෘතික අංගයන් පිළිබඳව දරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම හා සහජීවනය වර්ධනය කිරීමේ අරමුණින් දහම් පාසල් දරුවන් ගුරුවරුන් හා දෙමව්පියන් සම්බන්ධ කරගෙන වැඩසටහනක් 2016 අගෝස්තු මස 23,24,25 යන දිනවලදී මහනුවර, පොල්ගොල්ල, ජාතික සමූපකාර සංවර්ධන ආයතන ශ්‍රවණාගාරයේදී අති සාර්ථක අන්දමින් පවත්වන ලදි. මෙම පාසල් වැඩසටහන සඳහා මෙම දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලය 05 ද, දහම්පාසල් ගුරුවරුන් 10 ද, ශිෂ්‍ය ශිෂ්‍යාවන් 40 ද, රියදුරු මහතයෙකුද සමග අහදියා සම්මේලනයේ නිළධාරි මහතෙකුගේද දායකත්වයක් ලබා දෙන ලදි.

❖ **මිහ්රාජ් දිනය සැමරීම**

මුහම්මද් නබි නායක තුමාණෝ අල්ලාහ් බැහැදැකීම උදෙසා සිදු වූ රාත්‍රි ගමන **මිහ්රාජ් ගමන** ලෙස හඳුන්වනු ලබන අතර, එම අවස්ථාවේදී පස්වේල් සලාතය ( අල්ලාහ් නැමදීම ) ත්‍යාගයක් ලෙස ලබා දෙන ලදි. මෙම අවස්ථාව සිහිකර මිහ්රාජ් දිනය සමරන අතර, මෙම වසරේ 2016 මැයි මස 04 වැනි දින ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය එම්.එච්.ඒ.හලීම් මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් කොළඹ 12, කොළඹ මහ පල්ලියේදී උත්සවශ්‍රීයෙන් සමරන ලදි.

❖ **පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් පොළොන්නරුව, හම්බන්තොට, පුත්තලම, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල පල්ලි දායක සභාවන්හි සාමාජිකයන් සඳහා සම්මන්ත්‍රණය ඔක්තෝබර් හා නොවැම්බර් මසවල පවත්වන ලදි.



## 08. වකුෆ් හා පල්ලි පරිපාලන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්.

මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර අරමුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් ඒ අනුව,

- දිවයිනේ සියළු දිස්ත්‍රික්කයන්හි මුස්ලිම් පල්ලි වල පරිපාලන කටයුතු කිරිම.
- මුස්ලිම් පල්ලි ලියාපදිංචි කිරිම.
- පල්ලි දායක සභාවල භාරකරුවන් පත්කිරීම.
- පල්ලිවල වාර්ෂික ගිණුම් වාර්තා ලබා ගැනීම හා පරීක්ෂා කර මුස්ලිම් පුණ්‍යාධාර භාර අරමුදලට දායක මුදල් ලබා ගැනිම හා අරමුදල පවත්වාගෙන යාම.
- මුස්ලිම් පල්ලි දායක සභාවල ගැටලු, අභියාචනා, පෙත්සම් සම්බන්ධිකරණය කිරිම, සමථයකට පත්කල නොහැකි ගැටලු වකුෆ් මණ්ඩලයට යොමු කිරීම

**වකුෆ් සභා කාර්යාලය**

නව පල්ලි 59 ක් මෙම වර්ෂයේදී ( 2016) ලියාපදිංචි කල අතර පල්ලි භාරකරුවන් 590 දෙනෙකු සඳහා නව පත්වීම් ලබාදී ඇත. වකුෆ් සභාව විසින් විභාග කර ලබාදුන් තීරණයන්ට එරෙහිව වකුෆ් විනිශ්වය සභාවට ඉදිරිපත් කළ නඩු ගණන 03කි. ඇපැල් උසාවියට නඩුවකුත්, මහේස්ත්‍රාත් උසාවියට නඩු 02කුත් වශයෙන් යොමුකර ඇත. දැනට විභාග වෙමින් පවතින තීන්දු ලබා නොදුන් නඩු ගණන 30 කි.

**වකුෆ් විනිශ්වය සභා කාර්යාලය**

අධිකරණ කොමිෂන් සභාව මගින් පත්කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වකුෆ් විනිශ්වය සභාවේ මාසික රැස්වීම් වාර ගණන 02කි. 2016 වර්ෂය සඳහා මුස්ලිම් පල්ලිවලින් ඉදිරිපත්වූ නඩු ගණන 10 කි. නඩු 09ක් විනිශ්වය සභාව වෙත යොමුකර ඇති අතර, විභාග වෙමින් පවතින නඩු ගණන 17 කි. මීට අමතරව 2015 වර්ෂයේදී ඉදිරිපත් වූ නඩු 05ක් ද විභාග වෙමින් පවතී. නඩු 07ක් සඳහා නියෝග ලබාදී ඇත.

## 09. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

### ❖ ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදුවී ඇති සෘජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය බලපෑම අවම කර ගැනීම සඳහා යෝජිත වැඩසටහන ක්‍රියාවට නැංවීම.

අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීමට අනුව ආගමික සැරසිලි කටයුතු වලදී සහ ආගමික උත්සවවලදී ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා පිළියෙල කරන ලද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති ආගමික ස්ථාන දැනුවත් කිරීමට අවශ්‍ය වැඩසටහන් සැලසුම් කරමින් පොලිතීන් භාවිතය අවම කිරීමට කටයුතු කර ඇත.

### ❖ ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය හා මත්ද්‍රව්‍ය නිවාරණ මාසය ප්‍රකාශයට පත්කිරීම.

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කෙරෙන **මතින් නිදහස් රටක්** ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙල යටතේ 2016 ජුනි මස මත්ද්‍රව්‍ය නිවාරණ මාසය තුළ **මතින් නිදහස් රටක්** නිර්මාණය කර ගැනීම සඳහා විශේෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සෑම දිස්ත්‍රිකයකම ප්‍රධාන ආගමික සිද්ධස්ථාන හරහා දියත් කරන ලදි.

### ❖ ජගත් පරිසර දින සැමරුම් වැඩ සටහන

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ජගත් පරිසර දිනය සැමරීම සඳහා 2016 මැයි මස 30 දින සිට ජුනි මස 05 දින දක්වා ක්‍රියාත්මක පරිසර සතිය තුළ පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව කාර්ය

මණ්ඩලය දැනුවත් කිරීමට හා පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසර හිතකාමී ඇසුරුම් භාවිතය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට කෙටි වැඩසටහනක් දියත් කරන ලදී.

- **ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය හා විශේෂ දිනය ක්‍රියාවට නැංවීම**

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව මෙම දෙපාර්තමේන්වේ සියලුම නිළධාරීන්ව සෞඛ්‍ය සම්පන්න හා ඒ මගින් ප්‍රීතිමත් ජීවිතයක් සඳහා ක්‍රීඩාවේ අගය සම්බන්ධයෙන් දැනුවත් කරමින් ක්‍රීඩා අමාත්‍යාංශය මගින් හඳුන්වා දුන් යෝජිත වැඩපිළිවෙල සාර්ථකව ක්‍රියාවට නංවන ලදි.

## 10. අභ්‍යන්තර විගණන හා විමර්ෂන අංශය මගින් ඉටු කරන ලද කාර්යයන්

දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා පාලන කටයුතු වල අභ්‍යන්තර පාලනය ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට අදාලව විගණනයන් සිදු කිරීම. එහිදී,

දෙපාර්තමේන්තුවේ ගිණුම් හා පරිපාලන කටයුතු පරීක්ෂා කර අඩුපාඩු පෙන්වා දී නිවැරදි කිරීමට කටයුතු කිරීම.

- එම අඩුපාඩු සකස් කර පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව කටයුතු කිරීම.
- විගණන විමසුම් වලට පිළිතුරු සැකසීම
- වාර්ෂික විගණනය සිදු කිරීම.

2016වර්ෂයට අදාල අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව - 06

2016 වර්ෂයට අදාල රජයේ විගණකාධිපති විගණන විමසුම් සංඛ්‍යාව - 08

## 10.දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි වූ බාධාවන් සහ දුෂ්කරතා

## 11.

**2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.**

| | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන | | 2016.12.31 දිනට මුළු වියදම | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඇස්තමේන්තුව (රු.) | මුළු ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | ප්‍රතිශතය |
| ප්‍රාග්ධන වියදම් | 31,160,000.00 | 31,880,000.00 | 30,349,684.15 | 95.20% |
| පුනරාවර්තන වියදම් | 104,930,000.00 | 106,462,121.00 | 97,124,260.26 | 91.23% |
| එකතුව | **136,090,000.00** | **138,342,121.00** | **127,473,944.41** | **92. 14%** |

ඉහත සඳහන් වැය විස්තර පරිදි දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පවතී. ඒ අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රතිශතය **92. 14%** ක අගයක් පෙන්නුම් කරන බව සඳහන් කරමි. ප්‍රාග්ධන වියදම් යටතේ

මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යන වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරිවීම් වලට හේතුව නව ගොඩනැගිල්ලට යාමට අපේක්ෂාව හේතුවෙන් දැනට සිටින ගොඩනැගිල්ල අලුත්වැඩියා නොකිරීම හා පැරණි යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමට යන වියදමට වඩා නව යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම රජයට වාසිදායක බව හැගී යාමත් නිසාය. .

දෙපාර්තමේන්තුවේ සියලුම මට්ටම් වල පුරප්පාඩු විශේෂයෙන් ම විධායක සේවා ශ්‍රේණියන්හී ඇති පුරප්පාඩු කාර්ය සාධන ඉලක්කයන් සපුරා ගැනීමට බාධාවක් විය.

දෙපාර්තමේන්තුවේ කාර්ය මංඩලය සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් සහ ඒහා බැදි අනෙකුත් පොදු පහසුකම් ප්‍රමාණවත් නොමැති වීම රාජකාරී ඉටුකිරීමේදී දුෂ්කරතාවයක් විය.

ඉහත බාධක සහ දුෂ්කරතා මධ්‍යයයේ දෙපාර්තමේන්තුවේ අරමුණු, ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා 2016 වර්ෂයේදී කටයුතු කරන ලද බව සඳහන් කරමි.



| | |
|---|---|
| **වෙබ් අඩවිය** | www.muslimaffairs.gov.lk |
| **විද්‍යුත් තැපැල** | dir@muslimaffairs.gov.lk |
| **දූරකථන අංක** | අධ්‍යක්ෂ - 011-2675367 |
| | කාර්යාලය - 011-2672646 |
| **ෆැක්ස් අංකය** | 011-2692147 |